පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| **07** |

# දෙවන වාර පරීක්ෂණය - 2019

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I , II

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ......................................................

...................................................... කාලය : පැය **02** යි.

### I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ස්ථිර අදහසක් නොමැතිව කටයුතු කිරීම , යන අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ වන්නේ ,

1. වක්කඩේ හකුරු හැංගුවා වාගේ 2. ඉබ්බා දියට දැම්මා වගේ
3. මඩේ සිටවූ ඉන්න වගේ 4. ගඟට ඉනි කැපුවා වගෙ

02. " වාසියක් සිදුවීම " යන්න සඳහා යෙදෙන ඉඟි වැකිය වන්නේ,

1. කරල පැහුණා 2. සායම ගියා 3. තරු පෙනුණා 4. ඉහේ මලක් පිපුණා

03. පහත දී ඇති වචන අතුරින් මහාප්‍රාණ අකුරක් යෙදී ඇති වචනය තෝරන්න.

1. පළල 2. ලේඛන 3. විශේෂ 4. කුලුණු

04. පහත සඳහන් වචන අතුරින් සඤ්ඤක අක්‍ෂරයක් යෙදී නැති වචනය වන්නේ ,

1. ගඳඹ 2. වෙළඹ 3. සුළඟ 4. මුග්ධ

- **05 - 06 ප්‍රශ්නවල නිවැරදි අක්‍ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරන්න.**

05. 1. පිළිසගළ 2. අබිප්‍රාය 3. ශිෂ්ඨාචාරය 4. පාශාණ

06. 1. ප්‍රදර්ශණය 2. ලක්‍ෂන 3. පරිහරනය 4. ශබ්ද කෝෂ

07. මධ්‍යම පුරුෂ උක්ත නාම පදයක් නොවන්නේ ,

1. නුඹ 2. තෝ 3. ඔහු 4. ඔබ

08. පුරුෂවාචී නාම පදයක් වන්නේ,

1. දෙන 2. සිටුතුමා 3. කුමරි 4. සෙර

- **මුලින් දී ඇති පදයට සමානාර්ථයක් ඇති පදය තෝරන්න.**

09. පොල් - 1. තාල 2. තල් 3. නෙරළු 4. රුක්

- **මුලින් දී ඇති පදයට විරුද්ධ පදය වන්නේ ,**

10. සරල - 1. සංකීර්ණ 2. බහුල 3. අවකීර්ණ 4. විරල

- **11 - 12 ප්‍රශ්නවල ඇති අදහසට ගැළපෙන තනි පදය තෝරන්න.**

11. යමෙකු හෝ යමක් සිහිපත් කිරීම.

1. මතකය 2. උපහාරය 3. අමරණීය 4. අනුස්මරණය

12. ජනයා බහුලව වාසය කරන ,

1. ජන ශුන්‍ය 2. ජනගහනය 3. ජනාකීර්ණ 4. ජනාවාස



EXAMRESULTS.LK

- **පහත වාක්‍යයේ අයත් නාම විශේෂණ පදය තෝරන්න.**

13. උතුම් මිනිසා කාගෙත් යහපත උදෙසා නිරන්තරයෙන් කටයුතු කරන්නේ ය.

1. මිනිසා  2. උතුම්  3. උදෙසා  4. යහපත

14. ගුරුවරු පාසල් දරුවන් වෙනුවෙන් ඇපකැප වී වැඩ කරති.

1. පාසල්  2. වෙනුවෙන්  3. වැඩකරති  4. ඇපකැප වී

- **15 - 16 ප්‍රශ්නවල මුලින් දී ඇති වචනවල අදහසට ගැළපෙන අදහස ඇති පිළිතුර තෝරන්න.**

15. බඩ සයින් -

1. බඩගිනි බැවින්  2. බඩ පිරුණු හෙයින්
3. පිපාසය බැවින්  4. බඩගිනි නැති බැවින්

16. පරිශ්‍රය -

1. පහසුව  2. පිරිසිදුව
3. ප්‍රසිද්ධ  4. වටපිටාව

- **17 - 18 ප්‍රශ්නවල ඉරි ඇඳි පදය කුමන ක්‍රියාපද වර්ගයකට අයත් දැයි තෝරන්න.**

17. අයියා පොත් පාඩම් **<u>කරමින්</u>** ගීත ද මුමුණ යි.

1. පූර්ව ක්‍රියා  2. මිශ්‍ර ක්‍රියා  3. අවසාන ක්‍රියා  4. ආශිර්වාද ක්‍රියා

18. උවැසිය මල් **<u>පුදා</u>** බැතියෙන් බුදුන් වැන්දාය.

1. පූර්ව ක්‍රියා  2. මිශ්‍ර ක්‍රියා  3. විධි ක්‍රියා  4. අවසාන ක්‍රියා

- **19 - 20 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු උක්ත/ආඛ්‍යාත පදය තෝරන්න.**

19. ....................................................... නිර්මාණශීලි භාණ්ඩ සෑදූහ.

1. වඩුවන්  2. වඩුවා  3. වඩුවෝ  4. වඩුවෙක්

20. ගායිකාවක් මිහිරි හඬින් ගීත ගායනා ..............................................

1. කරති  2. කළා ය.  3. කළේ ය.  4. කරන ලද්දා ය.

( ලකුණු 2 x 20 = 40 )

# II කොටස

01. පහත මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 160කට නොඅඩු රචනයක් ලියන්න.

i. පොදු දේපළ සුරකිමු.
ii. වැඩිහිටියන්ට සැලකීමට පුරුදු වෙමු
iii. මගේ මාතෘ භූමිය ශ්‍රී ලංකාවයි
iv. ජල සම්පත රැක ගනිමු

(ලකුණු 20 යි )

02. පහත දැක්වෙන පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. " ඇයි මැණියනි , මම කුමන අන්‍යායක් කළෙම් ද? "
(අ) මෙම පාඨය සඳහන් පාඩම කුමක් ද?
(ආ) මෙහි සඳහන් ' අන්‍යායක් ' යන්නෙහි අර්ථය කුමක් ද?
(ඇ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?

ii. සේපාලිකා මල් ගුලා - රෑට හොරෙන් හොලවලා
(අ) ඉහත පද්‍ය පාඨය අයත් පද්‍ය පන්තියේ නම කුමක් ද?
(ආ) මෙම පද්‍ය පන්තියේ රචකයා නම් කරන්න.
(ඇ) මෙම පද්‍ය පන්තිය උපුටාගත් කාව්‍ය සංග්‍රහය කුමක් ද?

iii. " යමු ද ඉස්සරහට මෙතැන සෙනග පිරිලනේ "
(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද ?
(ආ) මෙය ප්‍රකාශ කරන්නේ කවුරුන් ද?
(ඇ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

iv. " මා ඇස් හමුයේ මොහුගේ රාජ්‍යශ්‍රිය දකිමි "
(අ) මෙහි ' මා ' යනු කවුරුන් ද ?
(ආ) මෙහි සඳහන් 'රාජ්‍යශ්‍රිය' යන්නෙහි අර්ථය කුමක් ද ?
(ඇ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

v. සුර රද සමන් සමඟින් සුරඟන එවර
පැහැනද මදාරා පරසතු මල් පතර
කැරපුද වඳින රැඳි මුනි සිරිපා තඹර
..........................................................................

(අ) ඉහත කවියේ අවසාන පදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවිය ඇතුළත් පද්‍ය ග්‍රන්ථය කුමක් ද?
(ඇ) එම පද්‍ය ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

(ලකුණු 3 × 5 = 15 යි )

03. පහත කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වත්ත පුරා හිමිදිරියේ - සුදුපාටට මල් පිපිලා
මඳ සුළඟේ නැළවෙනකොට - හරිම ලස්සනයි
සුදු පාටින් බැබළි බැබළි - අකුරට යන පුංචි පැටව්
නැළවෙන මල්වලට වඩා - හරිම පියකරුයි

i. මෙහි මල්වලට වඩා පියකරු ලෙස හඳුන්වා ඇත්තේ කවුරුන්ද ?
ii. මෙහි දැක්වෙන 'අකුරට යන' යන්නෙහි අර්ථය කුමක් ද?
iii. මෙහි එන විශේෂණ පදයක් උපුටා දක්වන්න.
iv. 'හිමිදිරිය' යන්නට සමාන වචනයක් ලියන්න.
v. 'පිපිලා' යන්නට විරුද්ධ පදයක් ලියන්න

(ලකුණු 2 × 5 = 10 යි )

04. පහත ප්‍රශ්නවලින් එකක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

i. ඔබගේ පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය නැරඹීමට පැමිණෙන ලෙස දන්වමින් දෙමාපියන් හා වැඩිහිටියන්ට ආරාධනා කිරීමට සුදුසු ආරාධනා පත්‍රය ලියන්න. ( ඔබ පාසලේ කලා සංගමයේ ලේකම් යැයි සිතන්න )

නැතහොත්

ii. වර්තමානයේ පවතින විශාල පාරිසරික ගැටලුවක් වන්නේ කැලිකසළ බැහැර කිරීමයි. මෙහිදී පාසල තුළ එක්රැස් වන කැලිකසළ විධිමත්ව බැහැර කිරීම සඳහා අවශ්‍යතාවක්ව පවතින කසළ බඳුන් කිහිපයක් ඉල්ලා ඔබ පාසල අයත් ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙත යැවීමට සුදුසු රාජකාරී ලිපිය ලියන්න. ( ඔබ පාසල් පරිසර කමිටුවේ ලේකම් යැයි සිතන්න )

(ලකුණු 15 යි )